මගේ අංකය / My No / எனது இல } උමැප/අනු/කලාප/පා/10/10 ඔබේ අංකය / Your No / உமது இல } දිනය / Date / திகதி } 2022.11.08

සියලුම විදුහල්පතිවරුන් වෙත,

**2022 / 2023 ගුරු ස්ථාන මාරු**

උක්ත කරුණ සම්බන්ධව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අංක උමැප /අදෙ /පා /04/05 හා 2022.11.04 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව 2022/2023 - අන්තර් කලාප සහ කලාපය තුළ ස්ථාන මාරු සඳහා 2007/20 චක්‍රලේඛයේ විධි විධාන අනුව ස්ථාන මාරු සඳහා සුදුසුකම් ලබා ඇති ගුරුවරුන්ගේ අයදුම්පත් කැඳවන ලෙස උපදෙස් ලබා දී ඇත.

03. **2022 / 2023 අන්තර් පළාත් / ජාතික පාසල් ස්ථාන මාරු සිදු නොකරන බැවින්** නැවත දැනුම් දෙන තුරු අන්තර් පළාත් හා ජාතික පාසල් සඳහා ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම සිදු නොකරන ලෙසට උපදෙස් ලබා දී ඇති බැවින් එම ස්ථාන මාරු අයදුම්පත් මා වෙත ඉදිරිපත් නොකරන ලෙස වැඩිදුරටත් දන්වමි.

04. ස්ථාන මාරු අපේක්ෂා කරන ගුරු භවතුන් පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂයෙන් සැලකිලිමත්ව කටයුතු කරවීමට සලස්වන ලෙස වැඩිදුරටත් දැනුම් දෙමි.

i. 2022.12.31 දිනට කලාපයේ හෝ දැනට සේවයේ යෙදී සිටින පාසලේ වසර 05 ක සේවා කාලය සම්පූර්ණ කර තිබීම (අවුරුදු 05 ක සේවා කාලයක් සම්පූර්ණ නොවන ගුරුවරුන්ගේ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේපවන බැවින් එවැනි අයදුම්පත් නිර්දේශ කර එවීමෙන් වළකින ලෙස සියලුම විදුහල්පතිවරුන්ගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමි.)

ii. පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කර තිබීම.(අන්තර් කලාප සඳහා පමණි.)

iii. විගණන විමසුම් හා විනය පරීක්ෂණ නොමැතිවීම.(අන්තර් කලාප සඳහා පමණි.)

05. ගුරු සහයක පත්වීම් ලබා ඇති ගුරු භවතුන්ගේ පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කර ඇත්නම් , ඔබ පාසල්වල සිටින වසර 05 ක සේවා කාලය සම්පූර්ණ කළ එම ගුරු භවතුන් ද ස්ථාන මාරු සඳහා සුදුසුකම් ලබන බව දැනුවත් කරන්න.(කලාපය තුළ ස්ථාන මාරු සඳහා සේවය ස්ථිර කර තිබීම අවශ්‍ය නොවේ.)

06. කලාපය තුළ ස්ථාන මාරුවල දී 2022.12.31 දිනට අවුරුදු 55 ට වැඩි වුවද ස්ථාන මාරු වීම් අපේක්ෂා කරන්නේ නම් තමා ස්ථාන මාරුවීම් ලබා ගැනීමට කැමති බවට ප්‍රකාශයක් සහිත ලිපියක් ද සහිතව අයදුම්පත් යොමු කළ හැකි බවට ද ගුරුවරුන් දැනුවත් කරන්න. එසේම 2022.12.31 වන දිනට අවුරුදු 55 සම්පූර්ණ නොවන සියලුම ගුරුවරුන් ස්ථාන මාරු අයදුම්පත්‍ර ඉදිරිපත් කල යුතු බව අවධාරණය කරමි.

07. **ඒ අනුව අන්තර් කලාප හා කලාපය තුළ ස්ථාන මාරු අපේක්ෂා කරනු ලබන ගුරු භවතුන්ගේ අයදුම්පත්‍ර 2022.12.01 දිනට හෝ ඊට ප්‍රථම අදාළ සියලු අවශ්‍යතා සමඟ සම්පූර්ණ කර පාසල අයත්**

කොට්ඨාසයේ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලබා දීමට කටයුතු කළ යුතු අතර, ප්‍රමාද වී ලැබෙන කිසිදු අයදුම්පත්‍රයක් භාර නොගන්නා බව දන්වා සිටින අතර, ඒ පිළිබඳව ගුරුවරුන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. එසේම **2022.12.31** දිනට දැනට සේවයේ යෙදී සිටින පාසලේ වසර **5** සම්පූර්ණ වී ස්ථාන මාරු අයදුම්පත්‍ර යොමු නොකල ගුරුභවතුන් පසුව අනාවරණය වුවහොත් කලාප මාරුමණ්ඩලය නිර්දේශ කරන ඕනෑම පාසලක් වෙත ස්ථාන මාරු කරන අතර, ඒ සම්බන්ධව කිසිදු අභියාචනයක් භාර නොගන්නා බව ද ගුරුභවතුන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

08. එමෙන්ම අන්තර් කලාප හා කලාපය තුළ ස්ථාන මාරු සඳහා **අයදුම්පත්‍රය සමඟ** පහත ලියකියවිලි අනිවාර්යයෙන්ම ඇමුණුම් කර තිබිය යුතු අතර, අඩුපාඩු සහිත කිසිදු අයදුම්පතක් භාර නොගන්නා බව දන්වා සිටිමි. අදාල ලියකියවිලි ඇමුණුම් නොකිරීම හේතුවෙන් ලකුණු ලබා ගැනිමේ අවස්ථා මගහැරියාම පිළිබඳ වගකීම ගුරුවරයා විසින් දරාගත යුතුය.

- <u>කලාපය තුළ ස්ථාන මාරු සඳහා - අයදුම්පත් කට්ටල සංඛ්‍යාව 01</u>

  i. සත්‍ය පිටපත් බවට සහතික කරන ලද පත්වීම් ලිපියේ පිටපතක්.
  ii. විදුහල්පති විසින් සහතික කරන ලද කාලසටහනේ පිටපතක්
  iii. සත්‍ය පිටපත් බවට සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක්
  iv. සත්‍ය පිටපත් බවට සහතික කරන ලද විවාහ සහතිකයේ පිටපතක්
  v. සත්‍ය පිටපත් බවට සහතික කරන ලද වයස අවුරුදු 12 ට අඩු දරුවන්ගේ උප්පැන්න සහතිකවල පිටපත්
  vi. ස්ථාන මාරුව සම්බන්ධව විශේෂිත වූ දැනුම් දීම් තිබේනම් (ස්ථානමාරු අපේක්ෂකයාගේ සහ විදුහල්පතිගේ) ඇමුණුම් කරන්න . (අයදුම්කරුවාගේ ඉල්ලීම විදුහල්පති සත්‍ය බවට නිර්දේශ කර තිබීම හා එම ඉල්ලීම සනාථ කිරීම පිළිබඳ ලියකියවිලි ඇමුණුම් කිරීම අනිවාර්ය වේ. උදා:- වෛද්‍ය සහතික,ගර්භනි සටහන් පත් වැනි)
  vii. කලත්‍රයා අධ්‍යාපන සේවයේ නොයෙදෙන්නේ නම් කලත්‍රයාගේ සේවා ස්ථානය සහ ලිපිනය

- <u>අන්තර් කලාප ස්ථාන මාරු සඳහා - අයදුම්පත් කට්ටල සංඛ්‍යාව 03</u>
  **<u>(එක් අයදුම්පතක් සමඟ පහත ලියවිලිවලින් 01 බැගින් ඇමුණුම් කළ යුතුය)</u>**

  i. සත්‍ය පිටපත් බවට සහතික කරන ලද පත්වීම් ලිපියේ පිටපත් 03
  ii. සත්‍ය පිටපත් බවට සහතික කරන ලද පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කිරීමේ ලිපියේ පිටපත් 03
  iii. විනය පරීක්ෂණ හා විගණන විමසුම් නොමැති බවට ලිපිය සහ එහි සත්‍ය පිටපත් කරන ලද ලිපි පිටපත් 02
  iv. විදුහල්පති විසින් සහතික කරන ලද කාලසටහනේ පිටපත හා එහි සත්‍ය පිටපත් කරන ලද ලිපි පිටපත් 02
  v. සත්‍ය පිටපත් බවට සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපත් 03
  vi. සත්‍ය පිටපත් බවට සහතික කරන ලද විවාහ සහතිකයේ පිටපත් 03
  vii. සත්‍ය පිටපත් බවට සහතික කරන ලද වයස අවුරුදු 12 ට අඩු දරුවන්ගේ උප්පැන්න සහතිකවල පිටපත් 03
  viii. ස්ථාන මාරුව සම්බන්ධව විශේෂිත වූ දැනුම් දීම් තිබේනම් (ස්ථානමාරු අපේක්ෂකයාගේ සහ විදුහල්පතිගේ) ඇමුණුම් කරන්න . (අයදුම්කරුවාගේ ඉල්ලීම විදුහල්පති සත්‍ය බවට නිර්දේශ කර තිබීම හා එම ඉල්ලීම සනාථ කිරීම පිළිබඳ ලියකියවිලි ඇමුණුම් කිරීම අනිවාර්ය වේ. උදා:- වෛද්‍ය සහතික,ගර්භනි සටහන් පත් වැනි)
  ix. කලත්‍රයා අධ්‍යාපන සේවයේ නොයෙදෙන්නේ නම් කලත්‍රයාගේ සේවා ස්ථානය සහ ලිපිනය.

අයදුම්පත් භාර දීම

09. ඔබ පාසලේ සියලුම ස්ථාන මාරු අයදුම්පත්‍ර කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඔබ විසින් භාර දී භාරදුන් බවට ලබා දෙන ලදුපත් ලබා ගෙන ඒවා අදාළ ගුරුභවතුන් වෙත ලිඛිතව භාර දී භාර දුන් බවට සහතික කර ලබාගත් ලේඛනයේ පිටපතක් (ආකෘතිය A) ආයතන අංශයේ කළමනාකරණ සහකාර, පාලන 10, ඩී.ඒ.සඳුනි මදාරා මිය වෙත භාර දීමට කටයුතු කරන්න.

10. ඒ අනුව වෙනත් ආකාරවලින් ලැබෙන අයදුම්පත් පිළිබඳව වගකීම කලාප අධ්‍යාපන කාර්යාලය විසින් භාර නොගන්නා බවත් අයදුම්පත්‍රය භාරදුන් බවට ලබාදුන් ලදුපත රහිතව ඉදිරිපත්වන කිසිදු පැමිණිල්ලක් භාර නොගන්නා බවත් විශේෂයෙන් දැනුම් දෙන අතර, ඒ පිළිබඳව ගුරුභවතුන් ද දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

11. **එසේම පාසලට අදාළ ස්ථාන මාරු අයදුම්පත්‍ර භාර දීමේදී මේ සමඟ ඇමුණුම් කර ඇති ආකෘති පත්‍ර ද නිවැරදිව සම්පූර්ණ කර ලබා දීමට කටයුතු කරන ලෙස දන්වා සිටින අතර, (ආකෘති අංක 01,02)** ස්ථාන මාරු ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ඔබ විසින් සපයන තොරතුරු පදනම් කරගන්නා බැවින් සත්‍ය හා නිවැරදිම තොරතුරු ලබා දෙන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.එසේම සාවද්‍ය හා අසම්පූර්ණ තොරතුරු සැපයීම මගින් ගුරු ස්ථාන මාරු ක්‍රියාවලියේ දී පාසලට සිදුවන දුෂ්කරතා පිළිබඳව වගකීම ඔබ විසින් භාර ගත යුතු බවද අවධාරණය කරමි.

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
අනුරාධපුර.

මහේෂා මංජරිකා හෙට්ටිආරච්චි
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ.
කලාප අධ්‍යාපන කාර්යාලය
අනුරාධපුර

පිටපත්:-

i. ආණ්ඩුකාරවර ලේකම්,ආණ්ඩුකාර කාර්යාලය,උතුරු මැද පළාත - කා.දැ.පි
ii. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, උතුරු මැද පළාත. - කා.දැ.පි.
iii. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ.පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, උ.මැ.ප - කා.දැ.පි
iv. කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ, කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - අයදුම්පත්‍ර ලබා දෙන පිරික්සුම් පත අනුව භාර ගැනීම හා භාරගත් බවට ලදුපත් නිකුත් කිරීමටත් ,අයදුම්පත්‍ර හා පිරික්සුම් පත් කලාපය තුළ හා අන්තර් කලාප ලෙස වෙන වෙනම ගොනු ගත කර කලාප අධ්‍යාපන කාර්යාලයේ ආයතන අංශයේ කළමනාකරණ සහකාර , පාලන 10, ඩී.ඒ.සඳුනි මදාරා මිය වෙත භාර දීමට.

(නැගෙනහිර නුවරගම් පළාත , මධ්‍යම නුවරගම් පළාත , නොච්චියාගම , නාච්චාදූව , රඹෑව , විලච්චිය)

කලාප අධ්‍යක්ෂ / Zonal Director / வலயக் கல்விப் பணிப்பாளர் - 025 2225332 (Fax)
පාලන අංශය / Admin Unit / நிர்வாகப் பிரிவு - 025 2223030 (Fax)
සැලසුම් අංශය / Planning Unit / திட்டமிடல் பிரிவு - 0252220214 (Fax)
සංවර්ධන අංශය / Development Unit / அபிவிருத்திப் பிரிவு - 025 2234807 (Fax)
ගිණුම් අංශය/වැටුප් / Account Unit / நிதிப்பிரிவு - 025 2234808 (Fax)
E mail - ncpanueducation@gmail.com
Web - www.anueducation.lk
Facebook - කලාප කාර්යාලය අනුරාධපුර
Official SMS Alert - ZEO_A.pura

ආකෘති අංක **01**

## කලාපය තුළ ස්ථාන මාරු වීම් සඳහා

පාසල:- ..............................................................................

අධ්‍යාපන කොට්ඨාසය :- ..............................................

| අ/ අ | නම | පෞද්ගලික ලිපිනය | ගුරු වර්ගය | පත්වීම් දිනය | පත්වීම් විෂය | උගන්වන විෂය(වැඩි කාලච්ඡේද සංඛ්‍යාවක්) | උගන්වන ශ්‍රේණි | පාසලට පැමිණි දිනය | පාසලේ සක්‍රිය සේවා කාලය | වෙනත් පාසලකට අනුයුක්තව සිටී නම් අනුයුක්තව සිටින පාසල සහ අනුයුක්තව සිටින කාලය | දීර්ඝ කාලීන /වැටුප් රහිත නිවාඩු ලබා තිබේ නම් හේතුව සහ කාලය | අයදුම්පත්‍රය ලබා දී ඇත/නැත | ස්ථාන මාරුව පිළිබඳ නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |

මෙම පාසලේ පවත්වාගෙන යනු ලබන ලොග් සටහන් පොතට අනුව 2022.12.31 දිනට අවුරුදු 05ට වැඩි සේවා කාලයක් ඇති,

01. සියලුම ගුරුවරුන්ගේ අයදුම්පත්‍ර මේ සමඟ ඇමුණුම් කර ඇති බැවින් හා ඒ පිළිබඳ විස්තර මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බැවින් එම තොරතුරු නිවැරදි බවට සෑහීමකට පත්වීමෙන් අනතුරුව සහතික කරමි.

02. ස්ථාන මාරු නිර්දේශ කරන අතර ලබා දෙන ස්ථාන මාරුව ක්‍රියාත්මක කිරීමට එකඟ වෙමි.

03. සාවද්‍ය තොරතුරු සපයා තිබීම හෝ කිසියම් තොරතුරක් සිතා මතා යටපත් කිරීමක් සිදු කර ඇත්නම්, මාගේ විනය බලධාරයාට වාර්තා කරනු ලැබීමට මම එකඟ වෙමින් පහත අත්සන් තබමි.

..............................................

විදුහල්පති

ආකෘති අංක **02**

අන්තර් කලාප ස්ථාන මාරු වීම් සඳහා

පාසල:- ..................................................................

අධ්‍යාපන කොට්ඨාසය :- ..............................................

| අ/ අ | නම | පෞද්ගලික ලිපිනය | ගුරු වර්ගය | පත්වීම් දිනය | පත්වීම් විෂය | උගන්වන විෂය(වැඩි කාලච්ඡේද සංඛ්‍යාවක්) | උගන්වන ශ්‍රේණි | කලාපයට පැමිණි දිනය | කලාපය තුළ සක්‍රීය සේවා කාලය | වෙනත් කලාපයක හෝ පළාතක පාසලකට අනුයුක්තව සිටී නම් අනුයුක්තව සිටින පාසල සහ අනුයුක්තව සිටින කාලය | ස්ථාන මාරු ඉල්ලන කලාපය | ස්ථාන මාරුව පිළිබඳ නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |

.............................................

විදුහල්පති

ආකෘතිය A

# 2022/2023 ස්ථාන මාරු අයදුම්පත්‍ර භාර දීම

කොට්ඨාසය:- ......................................................

පාසල :- ..............................................................

| අනු අංකය | ගුරුභවතාගේ නම | පත්වීම් විෂය | ලදුපත භාර ගැනීම | |
|---|---|---|---|---|
| | | | ලදුපත භාර ගත් දිනය | භාරගත් බවට අත්සන |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

...............................................

විදුහල්පති